# AIA බොනැන්සා - AIA හෙල්ත් ප්‍රොටෙක්ටර් සමඟින් ජයටම දිනන්න

## කුසපත් දිනුම්ඇදීමේ නීතිරීති හා කොන්දේසි

2026/04/01 සිට 2026/06/30 දක්වා කාලය තුළ AIA හෙල්ත් ප්‍රොටෙක්ටර් හි ආයෝජනය කළ දැනට සම්බන්ධව සිටින පාරිභෝගිකයින් කුසපත් දිනුම්ඇදීම සඳහා සුදුසුකම් ලබයි.

මේ සඳහා ඇතුළත් වන කරුණු:

තමන් සඳහාම නව රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීම.
පාරිභෝගිකයාගේ කලත්‍රයා සඳහා මිලදී ගත් නව රක්ෂණ ඔප්පුවක්.
පාරිභෝගිකයාගේ දරුවා/දරුවන් සඳහා මිලදී ගත් නව රක්ෂණ ඔප්පුවක්.

කලත්‍රයා හෝ දරුවා/දරුවන් විසින් මිලදී ගන්නා ලද රක්ෂණ ඔප්පු මඟින් ජයග්‍රාහකයකු ලෙස තෝරාගනු ලැබුවහොත්, සුදුසුකම් ලත් පාරිභෝගිකයා විසින් විවාහ සහතිකය සහ/හෝ උප්පැන්න සහතිකය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වනු ඇත.

- කුසපත් දිනුම්ඇදීම සිදු වන අවස්ථාව වනවිට වාරික ගෙවීම නිසි පරිදි සිදුකර තිබිය යුතු අතර ගෙවීම් සහන කාලපරිච්ඡේදය තුළ නොතිබිය යුතුය.
- ස්ථාවර නියෝග ශරහා වාරික ගෙවන රක්ෂණ ඔප්පුහිමියන් වෙත කිසියම් සම්මත සුදුසුකම් ලැබීමකට අමතර වශයෙන් කුසපත් දිනුම්ඇදීම සඳහා එක් අතිරේක අවස්ථාවක් හිමිවනු ඇත.
- එක් ජයග්‍රාහකයෙකුට පිරිනැමෙන තිළිණ ප්‍රමාණය එකකට සීමා වේ. කෙසේවුවද, වාරික ගෙවීම් ක්‍රමය සහ වාර්ෂික ශුද්ධ වාරික වටිනාකම මත පදනම්ව තෝරාගැනීමට ලක්වීමේ වරම් ඉහළ යයි.

**වාරික ගෙවීමේ ක්‍රමය**

| | | |
|---|---|---|
| වාර්ෂිකව | : | අවස්ථා 4යි |
| අර්ධ වාර්ෂිකව | : | අවස්ථා 3යි |
| ත්‍රෛමාසිකව | : | අවස්ථා 2යි |

**වාර්ෂික ශුද්ධ වාරික වටිනකාම මත පදනම්ව හිමි වන අවස්ථා**

| | | |
|---|---|---|
| ශ්‍රී.ල.රු. 200,000 - ශ්‍රී.ල.රු. 299,999 | : | අවස්ථා 1යි |
| ශ්‍රී.ල.රු. 300,000 - ශ්‍රී.ල.රු. 499,999 | : | අවස්ථා 3යි |
| ශ්‍රී.ල.රු. 500,000 සහ ඊට වැඩි | : | අවස්ථා 5යි |

(වාර්ෂික ශුද්ධ වාරිකය ශ්‍රී.ල.රු. 500,000 ඉක්මවන රක්ෂණ ඔප්පු සඳහා සෑම ශ්‍රී.ල.රු. 100,000කටම අමතර අවස්ථාවක්)

(උදාහරණ: ස්ථාවර නියෝග සහිතව වාර්ෂික ගෙවීම් ක්‍රමයක් හරහා ශ්‍රී.ල.රු. 600,000ක වාර්ෂික ශුද්ධ වාරිකයක් සහිත රක්ෂණ ඔප්පුවක් මිලදී ගන්නා සුදුසුකම් ලාභී පාරිභෝගිකයන්ට කුසපත් දිනුම්ඇදීම සඳහා අවස්ථා 11ක් හිමිවනු ඇත.)

එක් රක්ෂණ ඔප්පුවකට වඩා මිලදී ගන්නා සුදුසුකම්ලාභී පාරිභෝගිකයින්, කලත්‍රයන්, හෝ දරුවන් සෑම රක්ෂණ ඔප්පුවක් සඳහාම අවස්ථා හිමිවනු ඇත.

(උදාහරණ: ස්ථාවර නියෝග ෂහිතව ශ්‍රී.ල.රු. 400,000ක වාර්ෂික ශුද්ධ වාරිකයක් හිමි නව වාර්ෂික රක්ෂණ ඔප්පු 2ක් සඳහා අවස්ථා 16ක් හිමිවනු ඇත)

- ත්‍යාග වෙනත් අයෙකුට පැවරිය නොහැකි අතර මුදල් සඳහා හුවමාරු කළ නොහැකිය.
- වන්දි ගෙවීමකින් තොරව ප්‍රවර්ධන කටයුතු සඳහා සිය නම් සහ එකඟතාවන් භාවිත කිරීමට ඉඩදීමේ අයිතිය ජයග්‍රාහකයින්ට ඇත.
- කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක කුසපත් දිනුම්ඇදීම සහ එහි නීතිරීති වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය කුසපත් දිනුම්ඇදීමේ සංවිධායකයින් සතු වේ.

- AIA කාර්යමණ්ඩලය, වෙල්ත්ප්ලෑනර්වරුන්, සහ මූල්‍ය සැලසුම් විධායකවරුන් මෙම කූපත් දිනුම්ඇදීම සඳහා සුදුසුකම් නොලබයි.

***ජයග්‍රාහකයින් සඳහා හිමිවන ආකර්ෂණීය ප්‍රසාද තිළිණ මෙසේය,***

**ප්‍රථම ත්‍යාගයː ජයග්‍රාහකයින් 05 දෙනෙක් - වාර්ෂික ශුද්ධ වාරිකය ශ්‍රී.ල.රු. 500,000 සහ ඊට වැඩි**
**එක් අයෙකුට බැංකොක් වෙත යෑමට සහ ඒමට ගුවන් ටිකට්පත් 02ක් බැගින්**

**දෙවෙනි ත්‍යාගයː ජයග්‍රාහකයින් 10 දෙනෙක් - වාර්ෂික ශුද්ධ වාරිකය ශ්‍රී.ල.රු. 300,000 සිට 499,999 දක්වා**
**එක් අයෙකුට ශ්‍රී.ල.රු. 100,000ක් වටිනා හෝටල් වවුචර්පතක් බැගින්**

**තුන්වෙනි ත්‍යාගයː ජයග්‍රාහකයින් 20 දෙනෙක් - වාර්ෂික ශුද්ධ වාරිකය ශ්‍රී.ල.රු. 200,000 සිට 299,999 දක්වා**
**එක් අයෙකුට ශ්‍රී.ල.රු. 25,000ක් වටිනා තෑගි වවුචර්පතක් බැගින්**